

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## උතුරට කිරි ඉතිරේ නං බත සරුවෙයි බොලන්නේ

උදේ හිට මුන්දලා ලක ලැහැස්ති වෙන්නෙ මොකක් හරි හුට්ටප්පරේකට. මේක සිලපේදිරි ඇතුව දැනගන්ට පුලුවන් කොයින් මැණිකාගෙන්. ඕකි කොරන කියන දෙයක් හොයා අහනවට මනාප නැතුවා. ඕකි හිනා ගස්සන්ටත් එක් දිගේලි කරන්ට ඕනෙ මලිත්ති නගා කියා දුන්න පද පේලියක්.

*අත දරුවූ එදා උඹේ කැත කුණු අතගාපු මගේ*
*අතපය දැන් වාරු හිඳී අතදරුවෙක් වගේ ඇගේ*
*කැත කුණු මගෙ අතගාන්න උඹ දුව හිරිකිතයි වගේ*
*අතදරුවන් ලැබූ දාට දැනෙයි අම්ම කමක රගේ*

මගේ හඬ කන වැකුණ මැණිකා හරි කොරමින් හිටි හරුබස්ස පැත්තක තියලා අප්පුච්චාට අඬගෑවා.

"මේං බල අප්පුච්චා.. මේකා පදපේලි හඬ තලන අපූරුව.. "
"ඒක නොවැ බොල .. අපේ හේන් ඉම එකාලටත් ඉහළයි.. බොගේ කන් හොරොව්වට ඕවා දිගේලි කරන් මණ්ඩි රාළගෙ නෑම්බි මයෙ හිතේ.. හොඳා.. හොඳා.."
"මොකෑ මැණිකා මේ මහ රාළලා කොරන්ට තනන්නෙ?"

"ඩිංගිත්තක් ඔහොම ඉඳ.. බොටයි අප්පුච්චටයි දිවුල් ඉස්ම ටිකක් හරි කර අත තියනකං.. මේකට ඉහ පටලන්ට එකක් හරි කරපං අප්පුච්චා.."
"අර අහවල් එකක්ද කොයින් මාමා කොරන්ට තනන්නෙ?"

දිවුල් ඉස්ම පොල්කටුව මා අත තබන ගමන් මැණිකා කතාව පටන් ගත්තා..

"මේ අහ.. හෙට වෑ කණ්ඩියේ ඉතුරුම් මංගල්ලෙ (කිරි ඉතුරුම) .. බෝ යන්ට ඕනෑ.. මේ ඉම එකාලට උම ඉහටත් උඩින්.. උන්ගෙ හේන් හරි කරන්ට.. අසානාසි වලට.. උඹ වේල අවේලාව නොබලා නැහෙනවා කියලා උං උඹට ලෙංගතුයි.. උංගෙ පපු කැවුතු වල අම්මල අප්පලාටත් වඩා උඹයි ලැග ඉන්නෙ.. දේව කාරියෙන් පහු නමෝ විත්තියෙන් සප්පායම උඹ අත තියන්ට ගමේ එකාල සකසුරුවං වෙන්නෙ.. උඹට පණ ඇරලා ඉන්න මලිත්ති ලවා සප්පායම උඹ අත තියන්ට ඕං.. "

"මේකි බින්න ඇද බානවද මාමා?"
"මොකෑ නැතුව.. හෙට කෙම්මුර දා.. ඇටි කුබ්බා බුඃ ගහන්ට කලියෙන් නැගිට වෑ කණ්ඩියට යන්ට ඕනෑ.."

"කොයින් මාමා.. මට මේකලා අත රුපියල් කොල ටිකක් මිට මොළවන්ට ඕනෑ.. මට සුදු සරමක් ගන්ටත් ඕනෑ.. බෝ මට ගෙනත් දුන්න පිරුවට එමටයි.. මං ඒවා හරි කොරන්නං.. කාසි කොලත් මා ළඟ ඇති.. මේ ඉර මුවාවෙන වෙලේ අහවල් එකට සේයිලමට රෑටන්නෙ.. ඔහෙ නිස්කාංසුවේ ඉඳ.. ඔය එන්නෙ බොගෙ නෑම්බි.. මොනෑ කෙළි පොදි කොරාන එන්නෙ..?"

"ආතා.. හෙට දොහේම පිළී නොකන හින්දා මං අයියට දඩ මස් ඇබින්දක් හරි කොරාන ආවා මිරිස් ආනමකුත් එක්ක.."

කොයින් මාමා මා දිහා බැලුවේ "සැර බීම" ටිකක් බොන්නට හොඳ වොලාවයි කියන්නා වගේ. අපි සැර බීම ඩිංගක් අරගෙන මලීලට පේන නොපෙනෙන විදිහට ඇන තියාගත්තා ගෙනාව දඩමස් ආනමේ රස බලන්ට..

ලුණු දෙහි මිශ්‍ර කර ඇඹරූ කොච්චි මිරිස් රස නහර පිනා යයි. අද අපි පිච්චූ මස් සමග කන "චිලී සෝස්" එකළ ගම්වල මිනිසුන් මිරිස් ආනම ලෙස භාවිතා කළ බව මෙහි සටහන් කිරීම වටියි.

සැර බීම ටිකක් තොල ගෑ මම මස් කෑල්ලක් මිරිස් ආනමට ඔබා කා බැලුවේ කොයින් මාමා දෙස හොරැහින් බලමිනි.

"මාමා කියාපංකො මලීට පද පේලියක් දිගේලි කොරන්ට කියලා.."
"කෙළී මේ අහ"
"මොකෑ ආතා.."

"හෙට මහතැන් එනවා කිරි ඉතුරුමට.. බොට පංගරාතු කොරලා තියෙන්නෙ මහතැන්ගෙ ඇහුම් බැලුම් හොයා කියන්ට.."
"හොඳා ආතා.."
"මහතැන් කියනවා පද පේලියක් දිගේලි කොරන්ට කියලා.."

"එහෙනං මං හෙට ඉතුරුම ගැනම කියඤ්ඤදං ආතා.. ඕං කනදි.."

මලිත්ති ගේ හඬ මා දෙසවන තුළ රැඳුනේ මෙලෙසයි.

*උතුරට කිරි ඉතිරේ නං බත සරුවෙයි බොලන්නේ*
*දකුණට කිරි ඉතිරේ නං වඳුරු වසංගත වෙන්නේ*
*නැගිහිරු දැක ඉතිරේ නං ගමේ සිරිය පෙන්වන්නේ*
*මළ හිරු දැක ඉතිරේ නං දනු වින්නැහියකි වෙන්නේ*

"අපූරුයි බොල .. කොයින් මාමා මලී ගේ හිස අතගාමින් කීවේ අපමණ සෙනෙහසිනි."

"මං යනෝ අයියණ්ඩි කලුව පාත්වෙන්ට කලින්.." ඈ යන මග දෑස දල්වා බලා සිටිනු දැක මැණිකා මෙසේ පැවසීය.

"ඒකි බොට පණ ඇර.."

බෝගල

මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩමවීමෙන් පසු ඇති වූ ආගමික, සමාජීය, ආර්ථික හා සංස්කෘතික පුණර්ජීවනය, මෙතෙක් ස්වභාවධර්මයා දේවත්වයෙන් සලකමින්, පුදමින් ජීවත් වූ නොදියුණු යයි සම්මත පිරිසකට තම ජීවිතය සකස් කර ගැනීමට මහඟු පිටිවහලක් විය. අපේ මුල් ඉතිහාසය ඉගෙන ගත්තේ මහා වංශය නම් මහා ග්‍රන්ථය පරිශීලනය කොට දැනගත් දැනුම් සම්භාරයෙනි. කෘතහස්ත කලාකරුවෙකු වූ සනත් අබේසේකරයන්ද තම නෙත මොහොතකට නවතා තබන්නට ඇත්තේ මේ ශ්‍රී ලාංකික සංස්කෘතිය උඩු යටිකුරු කළ දැවැන්ත සමාජ පෙරලිය සිදු කළ මහා වංශයේ මේ පරිච්ඡේදය හා පිටු අතරේය. එහි ප්‍රතිඵලය වූයේ ශ්‍රී ලාංකිකයන් හා විශේෂයෙන් බෞද්ධ ජනතාව අමන්දානන්දයට පත් කළ 'මහින්දාගමනය' නම් සිනමා කෘතියයි.

රූපවාහිනිය හා ටෙලිනාට්‍ය විකාශනයේ, මෙන්ම බොහෝ අනෙකුත් හේතුන්ගේ බලපෑමෙන් තරමක් අඩාල වූ අපේ චිත්‍රපටිය නැවතත් පොදු ජනතාව අතරට රැගෙන ඒමට බිහිවූ චිත්‍රපටි ප්‍රමාණය ගණන් කළ හැකි තරම් අල්ප වූ ප්‍රමාණයකි. විශේෂයෙන් පසුගිය කාලයේදී බිහිවූ නිර්මාණ පිරික්සා බැලීමේදී පෙනී යන විශේෂ කරුණක් වන්නේ දේශය ජාතියේ පෞඩත්වය හෙලිකරන, ඉතිහාසය ගවේශනය කළ චිත්‍රපට නිර්මානය. විශේෂයෙන් ජැක්සන් ඇන්තනීගේ අබා. ගාමිණී වැනි චිත්‍රපට මෑතකදී හැඳින්විය හැකිය. එයට මූලික වූ හේතුව විය හැක්කේ මුළු මහත් දේශයම විශේෂයෙන්ම බෞද්ධ ජනතාවගේ සිත් බෞද්ධාලම්බන ප්‍රීතියෙන් පුරවාලන්නට හේතුවෙනවාට සැකයක් නැත. අපේ ශ්‍රී ලාංකික ඉතිහාසය ආරම්භ වන්නේද මහින්දාගමනයෙන් සිදු වූ නිසාවෙනි. මෙහි අතුරුඵලයක් ලෙස අපට වැදගත් වන්නේ දහඅට කුලයක ජනයා සමඟ ශ්‍රී මහා බෝධිය ලංකාවට මහින්දාගමනයෙන් පසු වැඩමවීම සිදුවීමයි. මහින්දාගමනයෙන් ලක්දිව භික්‍ෂු සාසනය ඇති වූවා සේම අශෝක රජුගේ දියණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය නිසා භික්‍ෂුණී සාසනයද ශ්‍රී ලංකාවේ ආරම්භ වීමට හේතු විය. චිත්‍රපටය අවසන් වීමට ආසන්නයේ බෝධි ආගමනය ඉතා අලංකාර නෞකාවකින් වීම හදවත් තුල පහන් සංවේගය දැනවීමට හේතු වනවාට සැක නැත. මේ සඳහා දැවැන්ත වියදමක් හා අතිරේක වෙහෙසක් දැරීමට කළමණාකාරීත්වයට විදින්නට සිදුවීම නොවැලැක්විය හැක්කකි.

සනත්ගේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලාංකිකයන් හොඳින් දන්නා මහින්දාගමනය හා බෝධි ආගමනය ඒ ලෙසින්ම හදවත් තුල සැදැහැතිය වඩවාලමින්




*මහින්දාගමනය රොක් බැන්ක් පාරමිතා විහාරස්ථානයට ආධාර පිරිස නොවැම්බර් මස 13 වන දින එපින් රීඩින් සිනමාහලේ දී සවස 4 ට*

පසුකාලයේ සිදු වූ ත්‍රස්ත විපතින් මිදී නිදහස විඳීම යයි සිහිවීම අතිශයෝක්තියක් නොවේ. යමක් පොත පතින් හෝ අසා දැන ගැනීම මෙන්ම ඊටත් වඩා ඒ දැනගත් දේ චිත්‍රපටියක් ඇසුරින් දැකීම සිත වඩා එයට ග්‍රහණය කරගනී. මහින්දාගමනය චිත්‍රපටිය වඩා වැදගත් වන්නේ මේ නිසාය.

සනත් ඔහු ලැබූ ටෙලිනාට්‍ය පරිශීලනය කිරීම හා අධ්‍යක්‍ෂණය මෙම චිත්‍රපටිය සාර්ථක කරගන්නට

### මහින්ද දිසානායක දිවුල්ගනේ

පිටුවහලක් කරගන්නට ඇත. මහා වංශයේ සඳහන් වන මහානාග යුවරජුට රාජ්‍ය පවරා දීමට කිසි සේත්ම කැමති නොවූ අනුලා දේවිය තම පුතුට රාජ්‍ය ලබාදීමට රහසේ කටයුතු කරයි. ඇය ඒ සඳහා විවිධ උපක්‍රම රහසේ ම ක්‍රියාත්මක කරයි. එහෙත් වන විට රාජ්‍ය ක්‍රමය ක්‍රියාත්මක වූයේ සහෝදරයාගෙන් සහෝදරයාටය. හිමිවිය යුත්තේ සොයුරු මහානාග වෙතය. මේ අතරේ මහානායගයන් වැව ඉදිකිරීමට සේනාව සමඟ පිටත්වෙයි. එහිදී විශයෙදූ අඹගෙඩියක් පැසක අනිකුත් අඹ සමඟ යැවූ පසු එයින් අවසානයේ මරණයට පත්වන්නේ කිසිවක් නොදන්නා තම පුතුය. මෙයින් කළකිරීමට පත් අනුලාව පසු කාලයේ බුදු සසුන වෙත තදින්ම බැඳී කටයුතු කරයි. මේ ප්‍රධාන සිද්ධියට අමතරව එකල තිබූ යම් යම් ස්වභාවධර්මය සම්බන්ධකොට තිබූ ඇදහිලි සංස්කෘතික නොවූ මිනිස් ගැටුම්, ක්‍රෝධය, වෛරය, පලිගැනීම වැනි අසත්දර්ම ඉස්මතුකොට පෙන්වීමට වැඩි වෙහෙසක් දරා ඇති බවක් පෙනේ. මේ සියල්ල මිහිඳු හිමියන්ගේ ලංකාගමනයත් සමඟ වෙනස් වී අවිහිංසාවාදී දහම ඔස්සේ බුදු දහමට වඩාත් සමීපවීම වැලැක්විය නොහැක්කක් වේ.

මේ චිත්‍රපටියේ මුඛ්‍ය තේමාව වූ මහින්දාගමනය සිදු වීම ඉතා විචිත්‍ර ලෙස පෙන්වීමට අතීත ඉතිහාස සිදුම් පෙල උපකාරී වූවා සේම ශ්‍රී ලාංකික ජනීජනයාගේ ඓතිහාසික වූ කාලීන වැදගත්කමකින් යුත් සිනමා නිර්මාණයක් ප්‍රේක්‍ෂක ජනතාව වෙත ඉදිරිපත් කිරීමයි. මෙවන් ඉතිහාස කථාවක් බලා සිටින ප්‍රේක්‍ෂකයන් රසයෙන් උද්දීපනය කිරීම සඳහා අතුරු කථාවක් සම්බන්ධකොට තිබීම කාලෝචිත සේ දැනේ. අධ්‍යක්‍ෂවරයා මේ සඳහා ප්‍රවීන ශිල්පීන් රාශියක් හා නවකයන්ද නිසි පරිදි යොදා තිබීම චිත්‍රපටියේ ජීවය රදා තිබීමට හේතු වූවාට සැක නැත.

මේ දැවන්ත නිර්මාණය සඳහා දැවැන්ත නළු නිළි ශිල්පින් කැලක් මෙන්ම ශිල්පීන්ට අමතරව විශාල වියදමක්ද දැරීමට සිදුවී තිබුණද හොඳ නිර්මාණයක් හමුවේ එය එතරම් කටයුත්තක් නොවන්නට ඇත. නළු නිළියන් තෝරා ගැනිමේදී චිත්‍රපටි ඉතිහාසේ පැරණි ප්‍රවීණයන් වූ ජෝ අබේවික්‍රම, ක්ලීටස් මෙන්ඩිස් ජීවන් කුමරණතුංග මෙන්ම තිරිමාදුර, රොෂාන් පිළපිටිය, රොෂාන් රණවක, දිල්හානි වැනි වර්තමාන දක්‍ෂයන්ද රාශියක් යොදාගෙන තිබීම චිත්‍රපටිය සාර්ථක වීමට විචාරක පැසසුමට ලක්වීමට හේතු වී තිබේ. මහින්දාගමනය සඳහා සංගීතය රෝහණ වීරසිංහයන් අතින් නිර්මාණය වූ අතර පසුබිම් ගායනය නන්දාමාලිනී, දිවුල්ගනේ, සුනිල්, අමරසිරි පීරිස් හා උරේෂා රවිහාරි යන දක්‍ෂ හා ප්‍රවීණ ගායක ගායිකාවන්ගෙන් සැදුම් ලැබේ. එම ගීත පද රචනාවන්ගෙන් දායක වී ඇත්තේ මහාචාර්ය සුනිල් ආරියරත්න, පල්ලේගම හේමරතන හිමි, එල්ලාවල මේධානන්ද හිමියන් හා සනත් අබේසේකරයි. එපමණක් නොව මේ උසස් නිර්මාණය සඳහා ශ්‍රී ලංකා ජනාධිපති තුමාගේ පූර්ණ අනුග්‍රහය ලැබීමද පැසසිය යුතුය. එපමණක් නොව පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියන් දෙබස් ලිවීමේදී මූලික වී තිබීම ඓතිහාසික කතාවක වැදගත් සිද්ධියක් සේ සැලකිය හැකිය.

මහින්දාගමනය රොක් බැන්ක් පාරමිතා විහාරස්ථානයට ආධාර පිරිස නොවැම්බර් මස 13 වන දින එපින් රීඩින් සිනමාහලේ දී සවස 4 ට තිරගත කිරීමට කටයුතු යොදා ඇත.

www.sammasa.net / www.sannasa.com